**GMOA**

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

19-09-2012

**මාධ්‍ය නිවේදනය**

**ශ්‍රී ලංකා වෛද්‍ය සභාව වෛද්‍ය උපාධිය කප්පාදු කරයි.**

2004 වර්ෂයේදී සිට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් වෛද්‍යවරුන්ට ලබා දෙන ලියාපදිංචි සහතිකයේ (Entitle to practice Medicine & Surgery) "ශ්‍රී ලංකාව තුල වෛද්‍යවේදය සහ ශල්‍යවේදයේහි යෙදීමට අවකාශ ඇත" යන්න වෙනුවට වෛද්‍යවේදය පමණක් යෙදිය හැකි බව සඳහන් කරන ලදී.

ශ්‍රී ලංකා වෛද්‍ය සභවේ ලේකාධිකාරීවරයා 2012/09/14 වන දින අප වෙත එවා ඇති ලිපියෙන් ඉහත කරුණු සනාථ කර ඇති අතර පහත සඳහන් කරුණු අවධාරණය කර සිටියි.

- වෛද්‍යවේදයේ යෙදීම සඳහා යනුවෙන් (Entitle to practice medicine ) සඳහන් කලද එහි අර්ථය ශල්‍යවේදය ඇතුළු අනෙකුත් වෛද්‍යවේදයන් හි යෙදීමට අවකාශයන් ඇති බවය.

- මේ සම්බන්ධව වෛද්‍ය නිලධාරීන් අතර ඇති වු නොසන්සුන්තාවය හේතුවෙන් නැවතත් 2004 පෙර පැවති නාමකරණය එනම් "වෛද්‍යවේදය හා ශල්‍යවේදයේ යෙදීම" ලියාපදිංචි සහතිකයේ වෙනස් කිරීමට 14-09-2012 දින සිට තීරණය කරන ලද බවත්ය.

මෙහිදී ශ්‍රී ලංකා වෛද්‍ය සභාව 2004 වර්ෂයේදී ලියාපදිංචි සහතිකයේ නාමකරණය වෙනස් කිරීම , තීරණ ගත යුතු අදාල පාර්ශවයන්ගෙන් විමසීමකින් තොරව සිදු කිරීම සම්බන්දයෙන් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය දැඩි විරෝධය ප්‍රකාශ කරමු. ඉදිරියේදී වෛද්‍ය ප්‍රජාවට මේ ආකාරයේ බලපෑමක් ඇති විය හැකි කරුණු සම්බන්දයෙන් සියළු පාර්ශවයන්ගේ අනුමැතිය සහිතව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව තීරණ හා තීන්දු ගනු ඇතැයි රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය බලාපොරොත්තු වේ.

ස්තුතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්

වැඩි විස්තර - වෛද්‍ය නලින් ආරියරත්න 0714800942
වෛද්‍ය නවීන් ද සොයිසා 0718582444